Liberté • Égalité • Fraternité
RÉPUBLIQUE FRANÇAISE

MINISTÈRE DE LA JUSTICE

7

# අයිතීන් පිළිබඳ ප්‍රකාශනය

## රඳවා තබා ගන්නා බාලවයස්කරුවකු හට ඇති සහන

**(වයස අවුරුදු 10 සිට 13 දක්වා බාලවයස්කරුවන්)**

**පහත සඳහන් තොරතුරු තමා හට ලබා දිය යුතු වන්නේ තමාට තේරුම් ගත හැකි භාෂාවකින් ය.**

***පොලිස් අත්අඩංගුවේ පසු වන සම්පූර්ණ කාලය තුළ තමාට මෙම ලේඛනය තමා සන්තකයේ තබා ගත හැක***

තමා හට දන්වා සිටින්නේ තමා මෙලෙස රඳවා තැබෙන්නේ අවමය අවුරුදු 5 ක් වන සිරදඬුවමකින් දඬුවම් කළ හැකි නෛතික වරදක් සිදු කළ බවට හෝ සිදු කිරීමට තැත් කළ බවට ඒත්තු ගැන්වෙන බරපතළ තොරතුරු සහ තහවුරු කිරීම් තමාට එරෙහි ව ඇති නිසා ය.

ඔබ හට චෝදනා නගා ඇති වරදකාරී ක්‍රියාව සිදු කරන ලදැයි නිගමනය කර ඇති දිනය, ස්ථානය සහ ඊට අදාළ සීමා සම්බන්ධයෙන් ද රඳවා තබා ගැනීම සාධාරණීකරණය කළ හැකි හේතු දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.

පැය 12 දක්වා දිවෙන රඳවා තබා ගැනීම අතරතුර මෙකී ක්‍රියා පිළිබඳ ව ඔබගෙන් ප්‍රශ්න කෙරෙනු ඇත.

මෙකී කාල සීමාව අවසානයේ දී මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරන මහේස්ත්‍රාත්වරයා) විසින් තවත් අතිරේක පැය 12 ක කාලයකින් රඳවා තබා ගැනීම දීර්ඝ කිරීමට තීරණය කළ හැක. එසේ කිරීමට අපහසු අවස්ථාවන් හි දී අත්‍යවශ්‍ය වේ නම් වීඩියෝ දුරකථන සංවාද ජාල හරහා තමුන් ව මහේස්ත්‍රාත්වරයා වෙත පමුණුවනු ඇත.

රඳවා තබා ගැනීම අවසානයේ මහජන පැමිණිලිකරු ගේ (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාගේ) තීරණය මත මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම හෝ මුදා හැරීම සිදු කළ හැක.

**ඔබ හට තවදුරටත් දන්වා සිටින්නේ ඔබ හට ඇති අයිතීන් අතරේ:**

### යම් පුද්ගලයන් හට දැනුම් දීම

ඔබ ව රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් යම් නිලධාරියකු හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒජන්තයකු හෝ විසින් ඔබගේ දෙමාපියන්ට හෝ ඔබගේ භාරකරුට හෝ ඔබ ව භාර ව සිටින යම් පුද්ගලයකු හෝ යම් සේවයකට දැනුම් දෙනු ඇත.

ඔබ විදේශීය ජාතිකයකු නම් තවදුරටත් ඔබට ඔබගේ රටේ තානාපති අංශ වෙත දැනුම් දීමේ හැකියාව ඇත.
කෙසේ වෙතත් සිදු කරනු ලබන පරීක්ෂණ වල අවශ්‍යතාව සළකා බලා මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා හෝ කුඩා දරුවන් සම්බන්ධ විනිසුරුවරයා විසින්) එකී ඉල්ලීම් වලට විරුද්ධ විය හැක. නොවැලැක්විය හැකි තත්ත්වයන් යටතේ හැර ඔබගේ ඉල්ලීම සිදු කර උපරිම වශයෙන් පැය 3 ක කාලයක් තුළ ඉතා කඩිනමින් එකී ඉල්ලීම ඉටු කළ යුතු වේ.

### වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කරවා ගැනීම

ඔබ ව පරීක්ෂා කිරීම සඳහා වෛද්‍යවරයකු පත් කිරීම මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා හෝ කුඩා ළමුන් සම්බන්ධ විනිසුරුවරයා) විසින් සිදු කරනු ඇත. යම් අවස්ථාවක, රඳවා තබා ගැනීම දීර්ඝ කිරීමක දී ඔබ ව නැවත වතාවක් පරීක්ෂා කරවීම සඳහා මහජන පැමිණිලිකරු විසින් (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා හෝ කුඩා ළමුන් සම්බන්ධ විනිසුරුවරයා) විසින් වෛද්‍යවරයකු පත් කරනු ලැබේ.

### ප්‍රකාශ ලබා දීම, ප්‍රශ්න කිරීම් වලට උත්තර දීම හෝ නිහඬ ව සිටීම

ඔබගේ අනන්‍යතාව ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව වන පරීක්ෂණ අතරතුර ඔබට ඇති අයිතීන් නම්:
- ප්‍රකාශ සිදු කිරීම.
- ඔබගෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම.
- හෝ නිහඬ ව සිටීම සිදු කළ හැක.

**නීතිඥවරයකුගේ සහය ලැබීමට**

- **<u>නීතිඥවරයකු තෝරා ගැනීම</u>**

රඳවා තබා ගැනීම ආරම්භයේ දී සහ රඳවා තබා ගැනීමේ නියෝගය දීර්ඝ කිරීමක දී, එකී දිගු කිරීම ආරම්භ වන අවස්ථාවේ දී ඔබ විසින් තෝරා ගන්නා ලද නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඔබට ඉල්ලීමක් කළ හැක. ඔබ හට නීතිඥවරයකු පත් කර ගැනීමට හැකියාවක් නොමැත්තේ නම් හෝ තෝරා ගත් නීතිඥවරයා සම්බන්ධ කරගත නොහැකි නම් පත් කළ නීතිඥයකුගේ සහාය සඳහා ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය.

ඔබගේ නීතිඥවරයා තෝරා පත්කර ගැනීම ඔබගේ දෙමාපියන්ට හෝ ඔබේ භාරකරුට හෝ ඔබ භාර ව සිටින පුද්ගලයකුට හෝ සේවයකට ද සිදු කළ හැක.

නොඑසේ නම්, අපරාධ විමර්ශන නිලධාරියකු විසින් හෝ මහජන පැමිණිලිකරු විසින් (හෝ පරීක්ෂණය භාර මහේස්ත්‍රාත්වරයා හෝ කුඩා ළමුන් සම්බන්ධ විනිසුරුවරයා විසින්) කරනු ලබන ඉල්ලීමක් මත ඔබට සහාය වීම සඳහා නීතිඥවරයකු පත් කෙරෙනු ඇත.

- **<u>නීතිඥවරයාගේ සහය සහ මැදිහත් වීම් සඳහා වන සීමා</u>**

නීතිඥවරයා:
- ඔබ සමග මිනිත්තු 30 ක කාලයක් පුරාවට, ඔබගේ සාකච්ඡාවේ රහස්‍යභාවය සුරක්ෂිත වන ආකාරයේ තත්ත්වයක් සහිත ව ඔබ සමග සාකච්ඡා කරනු ඇත.
- ඔබ සම්බන්ධ විභාග කිරීම් සහ ප්‍රශ්න කිරීම් වල දී ඔබට සහාය වනු ඇත.

ඔබගේ පළමු ප්‍රශ්න කිරීම, ඔබගේ අනන්‍යතාව සම්බන්ධ කරුණු පිළිබඳ ව පමණක් වන්නේ නම් හැර, ආරම්භ කිරීම ඉදිරි පැය 2 ක කාලයක් සඳහා ඔබගේ නීතිඥවරයා නොමැති ව කළ නොහැක්කේ නම් ඒ බව දන්වා ඉල්ලීමක් කළ හැක. කෙසේ වෙතත්, පරීක්ෂණයේ අවශ්‍යතාව මත මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාගේ හෝ කුඩා දරුවන් සම්බන්ධ විනිසුරුවරයාගේ අනුමැතිය මත) ඔබගේ පළමු ප්‍රශ්න කිරීම ඔබගේ නීතිඥවරයා නොමැති ව වුව ද නොපමා ව ආරම්භ කළ හැකි වන්නේ ය.

විභාගයක් හෝ පරීක්ෂණයක් අතරතුර ඔබගේ නීතිඥවරයා පැමිණියේ නම් එකී ක්‍රියාව තාවකාලික ව නවතා, ඔබට ඔබගේ නීතිඥවරයා සමග සාකච්ඡා කිරීමට අවසර දිය යුතු වේ.

මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා හෝ කුඩා දරුවන් සම්බන්ධ විනිසුරුවරයා) සහ සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිශ්චයකරුවකුට, වරකට පැය 12 ක කාලයක් පුරාවට සහ එක් වරක් දීර්ඝ කිරීමකට යටත් ව, විශේෂිත හේතු කාරණා මත, ප්‍රශ්න කිරීම් අතරතුර දී ඔබ හට නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීම වැළැක්වීමට තීරණය කළ හැක්කේය.

**භාෂා පරිවර්තකයකුගේ සහාය ලබා ගැනීම**

ඔබට ප්‍රංශ භාෂාව කථා කළ නොහැකි නම් හෝ තේරුම්ගත නොහැකි නම් ඔබ හට කිසිදු ගාස්තුවක් නොමැති ව, ඔබගේ ප්‍රශ්න කිරීම අතරතුර සහ ඔබගේ නීතිඥවරයා සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාෂා පරිවර්තකයකුගේ සහාය පැතීමට අයිතිය ඇත.

**රඳවා තබා ගැනීම අවසන් කරන ලෙසට ඉල්ලීමට ඇති අයිතිය**

ඉදිරි රඳවා තබා ගැනීමේ නියෝගය දීර්ඝ කිරීමක් මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කළ අවස්ථාවක එම ක්‍රියාමාර්ගය දීර්ඝ නොකරන ලෙස මහජන පැමිණිලිකරු ගෙන්, හෝ කුඩා ළමුන් පිළිබඳ විනිසුරුගෙන් හෝ පරීක්ෂණය සිදු කරනු ලබන විනිසුරුගෙන් හෝ ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාව ඇත.

**ඔබගේ නඩු ගොනුවේ ඇති ඇතැම් ලේඛන වලට ඇති ප්‍රවේශය**

රඳවා තබා ගැනීම දීර්ඝ කිරීමකට ප්‍රථම ව ඔබගේ හෝ ඔබගේ නීතිඥවරයාගේ ඉල්ලීම මත පසු අවස්ථාවක දී ඔබට පහත දෑ පිරික්සීමට හැකි ය:
- ඔබගේ රඳවා තබා ගැනීමට අදාළ නීති කෘතීන්/සටහන්
- ඔබව පරීක්ෂා කරන ලද වෛද්‍යවරයා විසින් සපයන ලද වාර්තාව හෝ වාර්තා
- ඔබගේ ප්‍රශ්න කිරීම් හා සම්බන්ධ කාර්යය සටහන්

**නීති කෘත්‍යයන්හි ඊළඟ පියවර පිළිබඳ දැනුවත් වීම**

රඳවා තබා ගැනීම අවසානයේ, මහජන පැමිණිලිකරු විසින් කාර්යය පටිපාටිය අනුව අනෙකුත් කිසිදු පියවරක් ගෙන නොමැත්තේ නම්, එතැන් පටන් මාස 6 ක කාලයක් තුළ, එකී මහජන පැමිණිලිකරු විසින් ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් කිරීමට ඔබට හැකියාවක් ඇත.